කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි පළමුවන වසර පරීක්ෂණය (බාහිර)-2023

2025 - මැයි

# BCOME 1015 - කළමනාකරණ මූලධර්ම

මුළු ප්‍රශ්න සංඛ්‍යාව : හයයි (06) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

**ප්‍රශ්න අංක 01**

අ) කාර්යක්ෂමතාව සහ සඵලදායකත්වය අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

ආ) ටේලර්ගේ විද්‍යාත්මක කළමනාකරණ ප්‍රවේශය පිළිබඳ විවේචන හතර (04) කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 07)**

ඇ) හෙන්රි මින්ට්ස්බර්ග්ගේ කළමනාකරණ භූමිකාවන් සාකච්ඡා කර නවීන සංවිධානවල කළමනාකරුවන්ට ඔවුන්ගේ වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට එම භූමිකාවන් උපකාර කරන ආකාරය පැහැදිලි කරන්න. ඔබේ පිළිතුරට සහාය වීමට උදාහරණ සපයන්න.

**(ලකුණු 08)**
**(මුළු ලකුණු 20)**

**ප්‍රශ්න අංක 02**

අ) ආයතනික ඉලක්ක සපුරා ගැනීම සඳහා ඵලදායී සැලසුම්කරණය දායක වන්නේ කෙසේද? සාකච්ඡා කරන්න.

**(ලකුණු 05)**

ආ) සැලසුම් ක්‍රියාවලියේදී කළමනාකරුවන් මුහුණ දෙන අභියෝග පරීක්ෂා කර ඒවා ජය ගැනීමට උපාය මාර්ග යෝජනා කරන්න

**(ලකුණු 07)**

ඇ) "සැලසුම් කිරීමට අපොහොසත් වීම අසාර්ථක වීමට සැලසුම් කිරීමයි." මෙම ප්‍රකාශය විවේචනාත්මකව ඇගයීමට ලක් කරන්න.

**(ලකුණු 08)**
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 03

අ) තීරණ ගැනීම සෑම කළමනාකරණ කාර්යයකම වැදගත් අංගයක් ලෙස සලකන්නේ ඇයි? කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

ආ) තීරණ ගැනීමේ ක්‍රියාවලියේ පළමු පියවර ලෙස ගැටලුවක් නිවැරදිව හඳුනාගෙන නිර්වචනය කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

**(ලකුණු 07)**

ඇ) සංවිධානවල ඵලදායී තීරණ ගැනීමට ඇති බාධක කළමනාකරුවන්ට ජය ගත හැක්කේ කෙසේද? උදාහරණයක් සමඟ සාකච්ඡා කරන්න.

**(ලකුණු 08)**
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 04

අ) සංවිධානයක් තුළ දෙපාර්තමේන්තු සහ කණ්ඩායම් අතර නිසි සම්බන්ධීකරණය කළමනාකරුවන් සහතික කරන්නේ කෙසේද? කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

ආ) අවශ්‍ය අවස්ථාවලදී උදාහරණ දක්වමින්, මධ්‍යගත සහ විමධ්‍යගත ආයතනික ව්‍යුහයන් සංසන්දනය කරන්න.

**(ලකුණු 07)**

ඇ) "නිසි ලෙස නිර්මාණය කරන ලද සහ සමබර සංවිධානයක් ආයතනයේ කළමනාකරණය සහ ක්‍රියාකාරිත්වය යන දෙකටම පහසුකම් සපයයි." මෙම ප්‍රකාශය පිළිබඳව අදහස් දක්වන්න.

**(ලකුණු 08)**
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 05

අ) පරිවර්තනීය නායකත්ව (transformational leadership) විලාසය, ගනුදෙනු නායකත්ව (transactional leadership) විලාසයෙන් වෙනස් වන්නේ කෙසේද?

**(ලකුණු 05)**

ආ) සංවිධානවල විවිධ කණ්ඩායම් කළමනාකරණය කිරීමේදී නායකයින් මුහුණ දෙන අභියෝග තක්සේරු කරන්න.

**(ලකුණු 07)**

ඇ) කළමනාකරුවෙකු සහ නායකයෙකු අතර වෙනස්කම් සාකච්ඡා කරන්න. පුද්ගලයෙකුට කළමනාකරුවෙකු සහ නායකයෙකු යන දෙකම විය හැකිද? ඔබේ පිළිතුර උදාහරණ සමඟ සාධාරණීකරණය කරන්න.

**(ලකුණු 08)**
**(මුළු ලකුණු 20)**

ප්‍රශ්න අංක 06

අ) ඵලදායී කළමනාකරණයකදී සැලසුම් කිරීමේ සහ පාලනය කිරීමේ කාර්යයන් එකිනෙකට අනුපූරක වන්නේ කෙසේද? කෙටියෙන් පැහැදිලි කරන්න.

**(ලකුණු 05)**

ආ) ඉදිරි (feed-forward) , සමගාමී (concurrent) සහ ප්‍රතිපෝෂණ (feedback) පාලන ක්‍රම උදාහරණ සමඟ අගයන්න.

**(ලකුණු 07)**

ඇ) පාලන පද්ධති අධික ලෙස සීමාකාරී නොවන හෝ සේවක චිත්ත ධෛර්යයට හානිකර නොවන බව කළමනාකරුවන්ට සහතික කළ හැක්කේ කෙසේද? සාකච්ඡා කරන්න.

**(ලකුණු 08)**
**(මුළු ලකුණු 20)**